# රත්නපුර ප්‍රාදේශීය සභාව 2023.03.10 වන දින මහා සභා රැස්වීම

රත්නපුර ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2023.03.10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ දී පැවැත්විණි.

මෙදින රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය:-

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 02. | එන්.විජය ශ්‍රී ශාන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 03 | ටී.ප්‍රේමතිලක මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 04. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 05. | රණවක කළුආරච්චි මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 06. | අයි.ඩබ්ලිව් අකිල රෝෂන් ලක්මාල් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 07. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 08. | බී.ප්‍රියන්ත මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 09. | පී.වී.අයි.එල්.විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 10. | පී.වී.ඉසුරු ජයලත් විතාරම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 11. | යූ.කේ නන්දාවතී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 12. | නිශාන් දමිත් අල්ගම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 13. | කේ.ජී.එන්.අමරසිංහ මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 14 | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 15 | රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 16. | ඕ.කේ. සුගත් ජයවික්‍රම මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 17. | වජිරා නන්දනී මහත්මිය | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 18. | උදය කුමාර් මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 19. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ප්‍රා/ස/ගරු මන්ත්‍රී |
| 20. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | ආර්.බී.නාලක සුදත්සිරි හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ඊ.කේ.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | අනුෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ලලිත් බෝතුංගආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | ආර්.ඒ.පද්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 31. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

| | | |
|---|---|---|
| 01. | ඩබ්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ඩී.නිලන්ති දිපිකා යසරත්න මෙනවිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ඒ.එම්.නිලන්ති අමරකෝන් මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

**සහභාගීවූනිලධාරීන් :-**

01.එම්.ඒ.කේ.ටී.අමරසිංහ මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මිය - සංවර්ධන නිලධාරී

03. සංජීවනී නිරෝෂි මහත්මිය - සංවර්ධන නිලධාරී

04.අචලා නිශාන්ති මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2023.02.08 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම හා 2023.02.27 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

i. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් විසින් 2023.02.22 දිනැතිව රත්නපුර ප්‍රාදේශිය සභාවේ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සමගි ජන බලවේගය පක්ෂය නියෝජනය කරමින් 2023 පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා ලබාදීම මත එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

- ගරු මන්ත්‍රී වජිරා නන්දනී මහත්මිය
- ගරු මන්ත්‍රී උඩුකඳන කපුගේ නන්දාවතී මහත්මිය
- ගිද්දෝරුගේ නිහාල් අමරසිංහ මහතා
- රණසිංහ ආරච්චිලාගේ පත්මා නන්දනී මහත්මිය
- ගරු මන්ත්‍රී බෝතුංග ආරච්චිලාගේ ලලිත් මහතා
- ගරු මන්ත්‍රී මංජුල ශ්‍රී ලාල් බී ගමගේ මහතා

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**i.**රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හරහා වැටී ඇති ශ්‍රීපාදය වන්දනා කිරීම සඳහා වන එක් ගමන් මාර්ගයක් වන රජ මාවත භාවිතා කරන පිරිස් සඳහා වූ වැසිකිළි පහසුකම් හා ජල පහසුකම් වල තිබෙන අවම බව හේතුවෙන් බැතිමතුන්ට වන අපහසුව මඟහරවා ගැනීම සඳහා ඉහත පහසුකම් ලබාදීම සඳහා අනුග්‍රාහක ආයතන කිහිපයක් තෝරාගෙන ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අනුෂ විරාජ් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ii. 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු එහි ආදායම් වියදම් ගිණුමේ දැක්වෙන අතිරික්ත මුදල 2023 වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට වන පරිපූරක අයවැය ඉදිරිපත් කිරීමේ යෝජනාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී. .

අය ශීර්ෂය : සමුච්චිත අරමුදල හර 5000000.00

109 වැය ශීර්ෂය බැර 5000000.00

iii.2023 වර්ෂයට අදාළ පුහුණු සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

## 2023 වාර්ෂික පුහුණු සැලැස්ම

| පුහුණු වැඩසටහන | ඉලක්කගත කණ්ඩායම | පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණු | කාල පරාසය |
|---|---|---|---|
| **01**.කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන | සමස්ත කාර්ය මණ්ඩලය | විධිමත් ලෙස කාර්යාලය තුළ රාජකාරී කිරීම හා නිසි පරිදි ලිපි ගොනුවක් නඩත්තු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් පවත්වා ගෙන යාම | මාර්තු |

| | | | |
|---|---|---|---|
| **02**.ඵලදායිතා පුහුණු වැඩමුළුව | සමස්ත කාර්ය මණ්ඩලය | 5S සංකල්පය පිළිබඳව දැනුවත් කිරීම හා එය කාර්යාලයේ කාර්යක්ෂමතාවය උදෙසා ඉවහල් කර ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීම, 2023 ජාතික ඵලදායිතා තරඟාවලියට ඉදිරිපත් වීමට අවශ්‍ය දැනුම ලබා දීම. | අප්‍රේල් |
| **03**.ආයතන සංග්‍රහය පිළිබඳව පුහුණු වැඩමුළුව | සමස්ත කාර්ය මණ්ඩලය | ආයතන සංග්‍රහයේ එදිනෙදා රාජකාරී ඉටු කිරීමේදී වැදගත් වන පරිච්ඡේදයන් පිළිබඳව දැනුම ලබා දීම. | මැයි |
| **04**.ධනාත්මක චින්තනය පුහුණු වැඩමුළුව | මහජන නියෝජිතයින්ට හා සමස්ත කාර්ය මණ්ඩලය | ධනාත්මක චින්තනය පදනම් කර ගනිමින් කාර්යාලයේ අභිවෘද්ධිය උදෙසා රාජකාරී කිරීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම | ජූනි |
| **05**.ව්‍යවසායකත්ව පුහුණුව (ආහාර කල් තබා ගැනීම/ඇසුරුම් කිරීම/දේශිය විදේශීය අලෙවි ක්‍රම) | එක් ජන්ද කොට්ඨාසයකින් හඳුනා ගත් එක් පුද්ගලයෙකු බැගින් 22 ක් හා මහජන නියෝජිතයින් හා සමස්ත කාර්ය මණ්ඩලය | පවතින ආර්ථික තත්ත්වයෙන් මිදීම සඳහා ආහාර කල් තබා ගැනීම පිළිබඳව,ආහාර සුරක්ෂිත ලෙස ඇසුරුම් කිරීම, ඒවා විදෙශයන් වෙත යවා විදෙස් විනිමය උපයා ගන්නේ කෙසේද යන්න පිළිඉදව දැනුවත් කිරීමේ ප්‍රායෝගික පුහුණුව | අගෝස්තු |
| **06**.රසවින්දනය තුළින් මානව ශක්ති සංවර්ධනය පිළිබඳ පුහුණුව | මහජන නියෝජිතයින්ට හා සමස්ත කාර්ය මණ්ඩලය | අරමුණු ඉටු කර ගැනීම උදෙසා කාර්යක්ෂම හා සඵලදායී කාර්යාලයක් බිහි කිරීමට උචිත පරිසරයක් නිර්මාණය කිරීම | සැප්තැම්බර් |

**<u>කාල රාමුව</u>**

| පුහුණු වැඩසටහන | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන | | | ■ | | | | | | | | | |
| ඵලදායිතා පුහුණු වැඩමුළුව | | | | ■ | | | | | | | | |
| ආයතන සංග්‍රහය පිළිබඳව පුහුණු වැඩමුළුව | | | | | ■ | | | | | | | |
| ධනාත්මක චින්තනය පුහුණු වැඩමුළුව | | | | | | ■ | | | | | | |
| ව්‍යවසායකත්ව පුහුණුව (ආහාර කල් තබා ගැනීම/ඇසුරුම් කිරීම/දේශිය විදේශීය අලෙවි ක්‍රම) | | | | | | | | ■ | | | | |
| රසවින්දනය තුළින් මානව ශක්ති සංවර්ධනය පිළිබඳ පුහුණුව | | | | | | | | | ■ | | | |

iv. රත්නපුර ප්‍රාදේශීය සභාව සතු LF-4823 හා 59 -7692 අංක දරන වාහන වෙන්දේසි කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගෙන් ලබාගත් නිර්දේශිත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනිමට ඉදිරිපත් කරන ලදුව, සියළුම වාහන වෙන්දේසි කිරීම සඳහා පෙර අනුමැතියක් ලැබී තිබුණද ,ඩෙක්මා ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු ගේ නිර්දේශයට අනුව LF-4823 දරණ රථය පමණක් වෙන්දේසි කිරීමටත් 59-7692 අංක දරණ වාහනය අළුත්වැඩියා කිරීමටත් නිර්දේශ කර ඇති බැවින් හා මෙම වාහන වෙන්දේසි කටයුතු පිළිබඳව පරීක්ෂා කර බැලීමේදී එය නිසි ක්‍රමවේදයට සිදු නොවී ඇති බව නිරීක්ෂනය වන බැවින් මෙතෙක් සිදුකළ වාහන වෙන්දේසි කටයුතු සම්පූර්ණයෙන්ම අහෝසි කර නැවත නීත්‍යානුකූලව ප්‍රසම්පාදන කටයුතු කරමින් අදාල වාහන වෙන්දේසි කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

v. රත්ගඟ පොල්වත්ත මාර්ගය (කුමාර හංදිය දක්වා 2km) , රත්ගඟ වැලිකුඹුර මාර්ගය (2km) මාර්ග ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස පැවතියත් කාලයක් තිස්සේ මෙම මාර්ග ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කටයුතු සිදු නොවීම හේතුවෙන් අබලන් තත්වයට පත්ව ඇති අතර, එම අලුත්වැඩියා කටයුතු ප්‍රාදේශීය සභාවට සිදු කිරීමට මූල්‍යමය හැකියාවක් නොමැතිකම හේතුවෙන් පළාත් මාර්ග ලෙස නම්කර පළාත් මාර්ග අමාත්‍යංශා වෙතින් නඩත්තු කටයුතු සිදුකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කර ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා විසින් ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

05:01 හදිසි යෝජනා

I. රත්ගඟ ප්‍රධාන මාර්ගයේ සිට ඇත්තොට ,රත්ගම, කැකිල්ලවිල මාර්ගය හා දෙහෙනකන්ද මාර්ගයේ නා ගස හංදියේ සිට හැල කඳ දක්වා දිවෙන මාර්ගය පළාත් මාර්ගයක් ලෙස නම්කර නඩත්තු කටයුතු සඳහා පළාත් මාර්ග අමාත්‍යාංශය වෙත යොමු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

II. රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 163/දකුණු ගිලීමලේ වසමේ අතුරලිය ග්‍රාමයේ පිවිසුම් මාර්ගය අසළ බැක්හෝ යන්ත්‍ර යොදා පතල් කර්මාන්තය සිදුකරන අතර එම යන්ත්‍රයක් අනාරක්ෂිත ලෙස කොන්ක්‍රීට් මාර්ගයේ ධාවනය කිරීමේදී මාර්ගය ස්ථාන කිහිපයක කැඩී ගොස් ඇති අතර, අතුරලිය ගම නාම පුවරුවද කැඩී ගොස් ඇත. මෙම හානියට අදාල අලාභය ගෙවීමට අදාල ආයතනය හිමිකරු එකඟ වී ඇති බැවින් අලාභයට අදාලව සභාවේ කාර්මික නිලධාරී ලවා පරීක්ෂා කර ඇස්තමේන්තුවක් සකස් කර දෙන ලෙසත්, ඉදිරියට පතල් කර්මාන්තයට අදාලව වාහන ධාවනයේදී මාර්ග වලට හා ප්‍රදේශ වලට වන හානිය වලක්වා ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත දැනුම් දීමක් සිදුකිරීමද සුදුසු බව ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා , හා ගරු මන්ත්‍රී ප්‍රියන්ත පෙරේරා මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අනූෂ විරාජ් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

III. ගිලීමලේ උප කාර්යාලය තුළ ඇති ආයුර්වේද බෙහෙත් ශාලාව, මහජන පුස්තකාලය, නොදිරන කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානය , ආදී දෛනිකව සේවය කරන පිරිස් සඳහා පානීය ජල පහසුකම් හා සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් මේ දක්වා භාවිතා කළ ජලය ලබාගනු ලැබුවේ අසල තිබූ උල්පත් මාර්ගයෙන් වුවද නියඟ කාලවලදී එම ජල උල්පත් සීදි කාර්යාලයට ජල පහසුකම් නොමැති වීම නිසා කාර්යය මණ්ඩලය අපහසුතාවයට පත්වේ. එම අපහසුතාවය වළක්වා ගැනීම සඳහා ජලය ඇති ස්ථානයකින් ළිදක් කපා ස්ථිර ජල මාර්ග පද්ධතියක් සකස් කර ගැනීම තුළින් මෙම ජල ගැටළුව විසඳා ගැනිමට හැකියාව ඇත. මෙම ජල ගැටළුව සභා උපකාර්යාලයට පමණක් නොව ඒ අවට ඇති නිවෙස් කිහිපයකටද බලපා ඇත. එම නිසා ඔවුන්ගේද ජල ගැටළුවට සහනයක් ලෙස ස්ථිර ළිඳක් කපා ජල පද්ධතියක් සකස් කර ගැනීම සුදුසු ගරු මන්ත්‍රී සමන්පාලිත මහතා ස්ථිර කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

IV. විසල් ජල යෝජනා ක්‍රමය යටතේ පළුදු කරන ලද මාර්ග මේ වන විට අබලන් තත්වයට පත්වෙමින් පවතින නිසා වෙනුවෙන් සභාවේ තැන්පත් කර ඇති ඇප මුදල් යොදාගෙන පිළිසකර කිරීම සඳහා සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්ද්‍රාණී මැණිකේ මහත්මියගේ ගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

- මලංගම සමනළ උයන මාර්ග පද්ධතිය
- රයිෆල් රේන්ජ් මාර්ගය

- අට්ටාලවත්ත මාර්ගය
- ඇල්බට් වත්ත ට්‍රෙෂර් පාර්ක් මාර්ගය
- සඳමල්යාය මාර්ග පද්ධතිය
- මලංගම ප්‍රජා ශාලාව මාර්ගය
- වළඳුර මාර්ගයේ කෙටි මාර්ගය
- ආරිද්දගොඩ මාර්ගය
- ඇල්ලෙගෙදර මාර්ගය
- අට්ටාලවත්ත සිට පැරණි දුම්රිය මාර්ගය ෆාම්ගාර්ඩන් දක්වා
- ක්ලැරන්ඩන්වත්ත මාර්ගය
- අමුතාගොඩ ප්‍රධාන මාර්ගය
- අමුතාගොඩ සුසානභූමිය මාර්ගය (3 වන පටුමඟ)
- අමුතාගොඩ කරපිංච වක්වා මාර්ගය
- කැටලියන්පල්ල දේවාලෙගාව දක්වා පාර
- කැටලියන්පල්ල වැල්ලම්බර වත්ත මාර්ගය
- අමුතාගොඩ කුරුදුවත්ත මාර්ගය
- කහංගම මනනගෙවත්ත මාර්ගය
- කහංගම ගඟ දෙසට යන පාර
- ගොළුවාවිල මුදියන්සේ මාවත

V. හදිසි ආපදාවන්ට ලක්ව ඇති පහත සඳහන් මාර්ග පිළිසකර කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීමට සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු ටී. ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී. (ඇමුණුම් 01 )

VI. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම් ,ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැළසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුමත කිරීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

VII. 2020.06.15 දින සිට ආයුර්වේද ඖෂධ බෙහෙත් ශාලාවේ ස්වේච්ඡා සේවයේ යෙදී සිටින ඩබ්ලිව්.රසිනි හංසිකා විජේසිංහ මෙනවිය තමන් දිගු කාලයක් තිස්සේ සේවය කර ඇත් බවත්, දැනට පුහුණු කාලයක් ලබා දී පැමිණෙන දිනට හෝ දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ස්ථිර කම්කරුවෙකු නොමැති බැවින් හා ඖෂධ සංයෝජක නොමැති අවස්ථාවලදී වෛද්‍ය නිලධාරී තුමියගේ අධීක්ෂණය යටතේ සිදුකරන බැවින් මෙම අයගේ සේවය ආයතනයට ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා පැමිණෙන දිනට දීමනාවක් ලබා දීමේ පදනමින් සේවා ගිවිසුමක් මත සේවයේ යොදවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.කාරක සභාවල වාර්තා**

2023.02.22 වන දින මුදල් කාරක සභා වාර්තාව සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා විසින් සඳහන් කරනු ලැබුවේ එහි ඇති ඇතැම් ගෙවීම් හා තීරණ සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය බවයි. ඒ අනුව තීරණ අංක 06, 07,08,09,11,13 සම්බන්ධව ගරු සභාපතිතුමාගෙන් කරුණු විමසූ අවස්ථාවේදී කාරක සභාවක් බවට පත්කරන ලද සභාව ලේකම් තුමියගෙන් හා අදාල විෂයන් සම්බන්ධ නිලධාරීන්ගෙන් ඒ පිළිබඳව කරුණු විමසා පැහැදිලි කර ගන්නා ලද අතර, ඊට අදාල සංශෝධනයන්ද ඉදිරිපත් කරන ලදී. ඒ අනුව අංක 13ට අදාල වාහන වෙන්දේසිය සම්බන්ධව විනිවිධභාවයෙන් කටයුතු කර නොමැති බව නිරීක්ෂනය වන බැවින් එම වෙන්දේසි කටයුතු අහෝසි කොට නැවත විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් කටයුතු කරන ලෙස ගරු රොහාන් ශ්‍රියන්ත මහතා පැවසුවේය. එම තීරණයට අනුව 2023.30.10 වන දින මහා සභාවේ න්‍යාය පත්‍රානුකූලව යථාපරිදි කල් දී ඇති යෝජනා යටතේ තීරණ අංක iv හි සඳහන් වාහන වෙන්දේසියට අදාල අනුමැතිය නොලැබෙන බවට තීරණය කරන ලදී. මුදල් කාරක සභාවේ අංක 08 යටතේ ඇති 2013 වසරේ සිට අත්තිකාරම් පියවීමට ප්‍රමාද වීම සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කළ ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා පැවසුවේ රාජ්‍ය ආයතනයක් ලෙස මූල්‍ය ප්‍රමාද වීම් සිදුවීම යහපත් නොවන බවත් මින් ඉදිරියට මෙවැනි දේ සිදු නොවීමට නිලධාරීන් වග බලාගතයුතු බවත් පැවසුවේය. තීරණ අංක 06 යටතේ සඳහන් ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ගෙවීම් කිරීම මාස ගණනක් ප්‍රමාද වීම පිළිබඳවද සඳහන් කළ එතුමා පැවසුවේ මෙවැනි ගෙවීම් අනුමත කිරීම ගැටළු සහගත බවයි. මාසිකව ලබාගැනීමට නියමිතව ඇති දීමනාවක් එකවර ගැනීම කල නොහැකි බවයි. මෙසේ දිගු කාලයක් දීමනාව නොගැනීම සම්බන්ධව සොයා බැලීම නිලධාරීන්ගේද වගකීම බව එතුමා සඳහන් කළ අතර, මෙවැනි කටයුතු ඉදිරියට සිදුනොවිය යුතු බවද පැවසුවේය. අංක 09 හා11 යටතේ සභා අරමුදල්

ස්ථාවර තැන්පතුවක් දැමීම සුදුසු බවත්, එය වැඩි පොළී අනුපාතිකයක් ලබාදෙන බැංකුවක තැන්පත් කිරීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා විසින් යෝජනා කරන ලදී. ඒ අනුව මහා සභාවේ ඒකමතිකව තීරණයක් අනුව අදාල සංශෝධනයන්ට යටත්ව 2023.02.22 මුදල් හා ප්‍රතිපත්තිකාරක සභාව අනුමත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අනුෂ විරාජ් මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**I. ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා**

ගරු සභාපතිතුමනි අපි අවුරුදු පහක් තිස්සේ මාස හැටක් තිස්සේ නොයෙකුත් තර්ක විතර්ක කරමින් අදහස් ප්‍රකාශ කළා. අපි එසේ කටයුතු කළේ අපි ගෙදර ගියත් ඒ සියල්ලට වගකිව යුතු බැවින් අද සභාපතිතුමා නැහැ නිවාඩු ගිහින්ද අපරාද පරීක්ෂන දෙපාර්තමේන්තුවෙන් සභාවට පැමිණියා කියලා ආරංචියක් තියෙනවා. සභාවේ අපරාදයක් වෙළාද මංකොල්ලයක් වෙළාද මං අහන්න කැමතියි.මේ ගැන මුලින්ම අහන්න හිටියෙ මං හිතනවා උප සභාපතිතුමා ස්තුති කතාවේදී හෝ එය පැහැදිලි කරයි කියලා.

රටේ මේ වෙලාවෙ ලොකු දේශපාලනමය වශයෙන් බැලුවාම ලොකු කැළඹීමක් තියෙනවා. මහජනතාවත් ව්‍යාකූලත්වයට පත්වෙලා තිබෙනවා තියෙවා කියනවා නෑ කියනවා තියන්න ඡන්දයක් නෑ කියනවා මෙහෙම කියද්දී පුරවැසියො හැටියට අපිටනම් කියන්න තියෙන්නේ ජනාධිපතිකෙනෙක් නෑ කියලා තමයි යන්න එතුමා පැවසුවේය.

කාලෙන් කාලෙට විවිධ රැළි ඇවිත් තියෙනවා පහුගිය කාලෙ තාප්පවල චිත්‍ර ඇන්දා ඒ රැළි වලට මොකද වුනේ කියන්න කවුරුත් දන්නවා දැනුත් රැල්ලක් ඇවිත් තියෙනවා ඒ රැල්ලට වෙන දේත් බලාගතහැකි බව එතුමා පැවසුවේය. ලංකාවේ ප්‍රාදේශිය සභා කොට්ඨාශ ලෙස හාර දහස් නවසිය දාහතක් තිබෙනවා. ඒ කොට්ඨාශ බෙදී ගිය ආකාරය දැකගන්න ලැබුණා . අද සභාවේදී මං ජනතා විමුක්ති පෙරමුණ ගැන කතා කරනවා එම කොට්ඨාශ හාර දහස් නවසිය දාහතෙන් එක් කොට්ඨාශයක් පමණයි ජනතා විමුක්ති පෙරමුණට දිනාගන්නට හැකිවුනේ එය පානදුර නගර සභාවේ එක් කොට්ඨාශයක් ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වරියන් 434ක් ඉන්නවා ලංකාවේම ජනතා විමුක්ති පෙරමුණේ. මං මේක කියන්න හේතුවුනේ අද බොහොම රැල්ලට යනවා අපි වැඩ කරන්නෙ පඩි නැතුව , දීමනා නැතුව, එතකොට ගමේ ජනතාව අහනවා ඒගොල්ලො විතරක් කොහොමද දීමනා නැතිව වැඩ කරන්නේ. අන්න ඒකට පැහැදිලි කිරීමක් තමයි මම මේ කරන්නේ .රත්නපුර ප්‍රාදේශිය සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා දීමනාව ගන්නේ නැද්ද, වෙන කෙනෙක්ද ගන්නේ ඒක හොයලා බැලුවාම මොවුන්ගේ දීමනාව සම්පූර්ණයෙන් යන්නේ පක්ෂ අරමුදලට ලංකාවේ ඉන්න 434 දෙනාගේම දීමනාව යන්නේ පක්ෂ අරමුදලට. මේ අවුරුදු පහට පහළොස් දහස ගානේ ලංකාවේම කෝටි තිස් නවයක් ගිහින් තියෙනවා අරමුදලට මේ අයට තමන්ගේ වැඩ නොමිලේ කර දෙන්නත් පිරිස ඉන්නවලු ඉතින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දීමනාව හා මේ ප්‍රාදේශිය සභා මන්ත්‍රී දීමනා වල එකතුවෙන් තමයි අරමුදල බිලියන 12ක්ද 8ක්ද මං දන්නැහැ වෙලා තියෙන්නේ එහෙමයි. මේකෙන් තමයි මේ ඔක්කොම නඩත්තු වෙන්නේ. අපිනම් ලේකම්තුමා හරහා මේ දිමනාව පමණයි ගන්නේ මේකෙන් කොන්ත්‍රාත් කරන්නේ නැහැ වෙන යටි ක්‍රමයකින් හම්බ කරන්නෙත් නැහැ කරන්න දෙන්නෙත් නැහැ. අපි ඒකට විරුද්ධ බව එතුමා පැවසුවේය. අපි හෘද සාක්ෂියට විරුද්ධව ජනතා මුදල් අවභාවිතා කරන්නේ නැහැ හැබැයි ඔෆිෂියල් රුපියලක් හරි එන්න තියෙනවා නම් ගන්නවා. රැල්ල නොවෙයි ඕනි යථාර්තයට මුහුණ දෙන්න ඕනි කියලා මේ රට නිවැරදි දිශාවට යන්න නම් නිවැරදි පිරිසක් පැමිණිය යුතු බව එතුමා සඳහන් කළේය.

අපේ රටේ දැන් ඉන්න නායකයාට තියෙන්නේ ජනතාවත් එක්ක වෛරයක් බවත් ජනතාව පැන්නුව අන්තිමට ඒ වෛරය පිරිමහන්න කටයුතු කරන බව එතුමා පැවසුවේය. සභාවට නැවතත් ඒමට හැකියාවක් ලැබුනොත් මීට වඩා වගවීමෙන් හා වගකීමෙන් වැඩ කටයුතු කළ යුතුයැයි එතුමා පැවසුවේය.

**II. ගරු මන්ත්‍රී වී.ප්‍රේමතිලක මහතා**

අවසන් සභාව කියලා හැමෝම කියනවා. මේ 19න් පස්සේ අපේ තනතුරු අහෝසි වෙනවා කියලයි දැනගන්නට ඇත්තේ එහෙම වුනොත් මේ සභාවෙ කතා කරන අවසන් සභාව වන බව එතුමා පැවසුවේය. මම ආපහු ඡන්දෙ ඉල්ලන්න බලාපොරොත්තුවක් නැහැ නාම යෝජනාවලට අත්සන් කළෙත් නැහැ. නමුත් දේශපාලන කටයුතු වලට සම්බන්ධ වෙලා වැඩකරනවා.

1997 මාර්තු මාසෙ තමයි මම මේ සභාව නියෝජනය කළේ.අවුරුදු විසි පහක් තිස්සේ මගේ කොට්ඨාශයේ ජනතාවට කොන්දේසි කඩන්නැතුව සේවය කළා.මට සතුටු වෙන්න පුළුවන් ජනතාවට මට හැකි පමණින් මගේ කාලය තුළ ඉටු කළා කියලා. අපිට තවත් වැඩි කලක් සේවය කරන්නට කාලයක් නොමැති නිසා වෙනත් කෙනෙකුට අවස්ථාව ලබාදුන් බව එතුමා සඳහන් කළේය.

මට විශාල වශයෙන් සේවය කරන්නට සහයෝගය දුන් පිරිසක් ඉන්නවා මං හිතන්නේ මේ අවස්ථාව මගේ යුතුකම ඔවුන්ට ස්තුතිය පුදකරන්නට අවස්ථාවක් කර ගතයුතු බව එතුමා පැවසුවේය. 1997 රත්නපුර ආසනයේ හිටපු ආසන සංවිධායක තුමා වන නාලන්ද එල්ලාවල මැතිතුමා සිහිපත් කරන්න ඕනේ. මට අපේක්ෂකත්වය ලබාදුන්නේ එතුමා. එදා සිට අද වන තෙක් සිට රත්නපුර දිස්ත්‍රික්කයේ ආසන සංවිධායක වරුන්ට ස්තුතිවන්ත වන බවත්, ඔවුන්ගේ සහයෝගය නොමදව එතුමාට හිමි වුන බව එතුමා සඳහන් කළේය. ජනතාව වරමක් දුන් නිසා තමයි මට මේ සේවාව කරන්න හැකියාව ලැබුනේ.සභාපතිවරු තිදෙනෙක් යටතේ මට සේවය කරන්න හැකියාවක් ලැබිලා තියෙනවා. බන්ධුල එස් කරවිට මැතිතුමා, නිහාල් අමරසිංහ මැතිතුමා , සුදත් දිසානායක මැතිතුමා යටතේ වැඩ කරලා තියෙනවා .ඔවුන්ගේ සහයෝගය නොමදව ලැබිලා තිබෙනවා. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතාවට අපි සේවයක් සිදුකර තිබෙන බව එතුමා පැවසුවේය. අපි හම්බ කරගත්ත දෙයක් නැහැ නමුත් අපි ජනතාවගේ ප්‍රසාදය ලැබිලා තියෙනවා. සෑම අවස්ථාවකම සභාවේ සිටි නිලධාරීන් සහයෝගය ලබා දී තිබෙනවා. ඒ අයටත් ස්තුතිය ගෞරවය පුද කර සිටිනවා. නැවත සභාවකදී හමු නොවුනත් පෞද්ගලිකව හමුවීම් සිදුවියහැකි බවත් , එතෙක් සියළුම දෙනාට ආයුබෝවන් කියා එතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

### III. ගරු මන්ත්‍රී කේ.නිරෝෂන් ලක්මාල් මහතා

එළඹෙන පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා සඳහා මම අත්සන් කළේ නැහැ. 2007 දී දිස්ත්‍රික් නායකයා වන ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාගෙන් අපි දේශපාලනයට පිවිසිලා ශාඛා සමිති ආරම්භ කර ඒ තුළින් 2018 පළාත් පාලන මැතිරණයට ඉදිරිපත්වෙලා ඡන්ද 2747 න් ඡන්ද 1500ක් අරන් කැටලියම්පල්ල කොට්ඨාශය ජනතාව මහජන නියෝජිතයෙක් ලෙස මේ සභාවට පත්කරලා එව්වා. නමුත් මේ අවුරුදු පහතුළ මේ ජනතාව වෙනුවෙන් මම යුතුකම් ඉෂ්ඨ කළා කියලා තමයි මම හිතන්නේ. ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු හිටියත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සිටියත් මගේ කොට්ඨාශයේ අඩුපාඩු රැසක් තිබ්බා ඒවා වෙනුවෙන් මැදිහත් වී කටයුතු කළා. පානීය ජල ගැටළුව කොට්ඨාශයේ පැවතුනා එය වාසු දේව ඇමතිතුමාගේ අමාත්‍යාංශය මගින් ඉටුකර ගැනීමට හැකිවු බව ගරු මන්ත්‍රීතුමා පැවසුවේය. නිවාස නොමැති පිරිසට නිවාස 4ක් හදලා දුන්නා. මම තාමත් ඉන්නේ කුලී නිවසක මට කරගත් දෙයක් නොමැති බවත් එතුමා පැවසුවේය. දැනට සභාපති පුටුවේ සිටින ජානක පුෂ්පකුමාර උප සභාපතිතුමා තමයි මට නාමයෝජනා අත්සන් කිරීමට අවස්ථාව සළසලා දුන්නේ මම මේ අවස්ථාවේදී ඒබව ගෞරවයෙන් සිහිපත් කරනවා.ඒ නිර්දේශය මත තමයි රංජිත් බණ්ඩාර මැතිතුමා තමයි මට නාම යෝජනා දෙන්න තීරණය කළේ. අපේ තිබෙන සමාජ ක්‍රියාකාරී වැඩපිළිවෙළ පිළිබඳව දැකලා තමයි ඔවුන් ඒ තීරණ ගනු ලැබුවේ.

අපි මොන මතිමතාන්තරවල සිටියත් ගරු සභාපතිතුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලය උදව් උපකාර කරපු අවස්ථාවන් තිබුණා මට කොරෝනා වැළඳුන අවස්ථාවේදී අපේ ප්‍රාදේශිය සභා සුභසාධක සංගමයෙන් ශාන්ත මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමා , උප සභාපතිතුමා රංජිත් ධර්මකීර්ති මන්ත්‍රීතුමා ඇතුළු සියළුම දෙනාගේ සහයෙන් මට ඒ අවස්ථාවේදී ලබාදුන් බඩු මල්ල ඉතාමත් වටිනා දෙයක් වූ බව එතුමා සඳහන් කළේය. ඒ අවසුථාවේදි මට උදව් උපකාර කළ සියළුම දෙනාට තම ස්තුතිය පුදකර සිටින බව එතුමා පැවසුවේය.

ප්‍රේමතිලක මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට පළාත් පාලන ඡන්දය නොපවත්වා කාලය දීර්ඝ නොකළ හොත් මේ මස 19 වන දින සභාවේ කාලය අවසන්වී විසිරෙනවා. එසේ වුනොත් මම මේ කතා කරන අවසන් අවස්ථාවයි. එම නිසා මේ අවුරුදූ පහ තුළ මෙම දේශපාලන ගමන යන්නට උදව් කළ ගරු සභාපතිතුමා , ගරු උපසභාපතිතුමා , ගරු මන්ත්‍රීවරුන් හා ලේකම්තුමාය ප්‍රධාන නිලධාරීන්ටත් වීදී ලාම්පු සවි කිරීම සඳහා සහයෝගය ලබා දුන් අනුර සහෝදරයාටත් ස්තුතිය ප්‍රකාශකරමින් තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

### IV. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා

මේ අවස්ථාවේදී සභාවේ ධූර කාලය මෙම මස 20දායින් පසුව අහෝසි වී ගියහොත් නැවත අලුතින් පිරිසක් පත්කර ගැනීම සඳහා පළාත් පාලන ඡන්ද විමසීම පැවත්විය යුතුයි. අපි විශ්වාස කරනවා නීතියේ ආධිපත්‍යට අනුව මැතිවරණය පැවත්වීමට කටයුතු කරයි කියලා . මෙම මැතිවරණයට නාම යෝජනා අත්සන් කළ නිවාඩු පිට සිටින රජයේ සේවකයන් පිරිසක් සිටිනවා. නිශ්චිතව දිනයක් වකවානුවක් නොකියා ඔවුන්ව අමාරුවේ දාපු බවක් තමයි පේනන්න තියෙන්නේ. මීට වඩා බලයක් තිබුණු පාලකයො එලවා හරිපු ඉතිහාසයක් අපේ රටේ තියෙන්නේ. ජනතා මතයට පයින් ගහලා මැතිවරණ කල් දාලා ඔය හමුදා නිලධාරීන් කිහිප දෙනෙකුට අවශ්‍යා පරිදි කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බව එතුමා පැවසුවේය.

මේ අවස්ථාවේදී මම ශෝකය ප්‍රකශ කරනවා නිවිතිගල ආසනයෙන් මෙවර මැතිවරණය ඉදිරිපත් වී සිටි නිමල් අමරසිංහ සහෝදරයාගේ අභාවයට .එය කොළඹ තිබුණු මැතිවරණය පවත්වන ලෙසට බල කෙරෙනු උද්ඝෝෂණයේදී එතුමා හදිසියේ අභාවයට පත් වූ බව එතුමා සඳහන් කළේය. ජනතාවාදී පාලනයක් උදෙසා මැතිවරණයක් පවත්වන ලෙස ඉල්ලමින් ඉදිරියටත් අපි ජනතාව වෙනුවෙන් උද්ඝෝෂන ව්‍යාපාර වලට සහභාගී වනවා. ජනතාව ඒකරාශී කරනවා අපි මෙය අවසන් කරන්නේ මැතිවරණයක් පැවැත්වීම සඳහා ආණ්ඩුවට බල කරමින් ක්‍රියාත්මක වුවාට පසුව බව එතුමා පැවසුවේය.

රොහාන් මන්ත්‍රීතුමා පැවසුවා අපේ වැටුප යන විදිය , කන බොන විදිය පිළිබඳව පාලනය වෙන්නේ කොහොමද කියලා . දැන් එතුමාලට මාතෘකාවක් හැදිලා තියෙනවා. ජනතා රැල්ල කොයි පැත්තටද

කියලා අමුතුවෙන් කියන්න ඕනි නැහැ.රටේ ප්‍රබල විපක්ෂය ලෙස මාලිමාව පැත්තට ඇවිත් තිබෙන බවත් කවුරු කොහොම කිව්වොත් ජනතාව තම පක්ෂයට පැත්තට ඒමේ රැල්ලනතර කළ නොහැකි බව එතුමා පැවසුවේය. වෘත්තිකයන් විශ්ව විද්‍යාල ආචාර්යයවරුන් මේ විරෝධතාවන්ට එයි කියලා හිතුවෙ නැහැ නමුත් ඔවුන් ජනතාවගේ පීඩනය වෙනුවෙන් හෙට දවසේත් පාරට බැහැලා විරෝධතාවය දක්වන බව එතුමා පැවසුවේය. රොහාන් මන්ත්‍රීතුමාට කියන්න තියෙන්නෙ පැහැදිලි කිරීම් අවශ්‍ය නැහැ. එතුමාගේ කතාවෙන් පැහැදිලි වුනා අපේ පක්ෂය ජයග්‍රහනය කොයි පැත්තටද යන්නේ කියලා. ඉදිරියේදි මන්ත්‍රීධූරය සඳහා පක්ෂ ප්‍රතිපත්ති ලෙස වෙනත් කෙනෙකුට අවස්ථාවක් ලබා දීමට කටයුතු කරන්නේනම් එයට ඉඩදී තමන් ඉවත් වන බවත් මන්ත්‍රීධූරය බලාගෙන දේශපාලන කටයුතු නොකරන බවත් එතුමා පැවසුවේය. අපේ වැටුප පක්ෂ අරමුදලට යනවා අරමුදල පිළිබඳව ජනතාවට විනිවිධ භාවයෙන් ඉදිරිපත් කර ඇති බව එතුමා පැවසුවේය. දේශපාලන කටයුතු ජනතාව වෙනුවෙන් ඉදිරියටත් සිදුකරන බව එතුමා පැවසුවේය.

## V. ගරු මන්ත්‍රී අනූෂ විරාජ් මහතා

ඡන්දය පිළිබඳ කතා කරනවා මම මේ කල්පනා කරන්නේ මේ අවස්ථාවේදී ජනතාව පත්වෙලා තිබෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක ජනතාවට අවශ්‍ය ඡන්දයද කියලා මට ප්‍රශ්නයක්. ජනතාවට අවශ්‍ය සහන බඩුමිල අඩුකරලා ඉස්කොළ ළමයින්ට පොත් පත් ටික මිළ අඩුවෙන් ලබා දෙන එක තමයි අවශ්‍යතාවය විය යුත්තේ .යම්කිසි ස්ථාවරයකට පත්වෙමින් පවතින අවස්ථාවේදී ඡන්දය තියන්න කියලා අරගල කරනවා. රට බාරගන්න කියන කොට කවුරුත් බාර ගත්තේ නැහැ. ඡන්දයක් තිබ්බා කියලා ජනතාවට සෙතක් වෙනවද තවත් අටදහස් පන්සියයක පමණ පිරිසක් පත්කිරීම රටට බරක් නොවේද යන්න එතුමා පැවසුවේය.

මේ අවස්ථාවේදී සංචාරකයින් පිරිසක් රටට එන වෙලාවේදී පාරවල් හරස්කර කටයුතු කිරීමෙන් ඔවුන් එන එකඳ වැළකෙන බවත්, මෙතෙක් කාලයකට රට කරගෙන යන පිරිසකට කරගෙන යාමට ඉඩ නොදී ජනතාව කුපිත කරමින් කටයුතු කිරීම තුළින් තමයි මේ රටට විනාශයක් සිදුවුනේ යන්න එතුමා පැවසුවේය. ඡන්ද තිබ්බා කියලා අටදහස් පන්සියයක් පත්කරගෙන මිනිස්සුන්ගෙ බඩකට පිරෙනවද කියලයි මට අහන්න තියෙන්නෙ. තමන්ගේ ආර්ථික ප්‍රශ්ණ පැත්තක තියලා ඡන්දයක් තියන්න කියලා මිනිස්සු දේශපාලකයෝ පස්සේ යන්නේ ඇයිද කියලා මට හිතාගන්න බැහැ යනුවෙන් එතුමා ප්‍රකාශ කළේය.

පාර්ලිමේන්තු මැතිවරණයක් නම් තිබ්බට කමක් නැහැ. කොහෙන් හෝ ආධාරයක් උපකාරයක් ලැබෙනවානම් අලුතින් පාර්ලිමේන්තුවක් ආවාට කමක් නැහැ. ප්‍රාදේශිය සභාවක් ආවා කියලා ජනතාවට සෙතක් වෙන්නේ නැහැ. මේ පත්වන අට දහසත් රටට බරක් මේක විසිරෝලා දාලා එම දීමනා ටිකත් ඉතුරු කර ගැනීම තමයි කළ යුත්තේ. එයින් ජනතාවට භාණ්ඩ හා සේවා වල යම් සහනයක් ලබා දීමට හැකියාවක් ඇතිවන බව එතුමා පැවසුවේය. අපි ජනතාවට සේවය කළ මිනිස්සු ඡන්දයක් තිබුණත් නැතත් අපි ජනතාව සමඟ ඉන්නවා. අපිත් නායකයෝ පත්කරලා පොළවෙ පස් කන තත්වයකට පත්වෙලා තිබෙනවා. නමුත් දැන් ටිකක් ස්ථාවරවෙමින් පවතිනවා මේ අවස්ථාවේදී හැමෝම ඡන්දයක් ඉල්ලන්නේ ඇයි කියන එක තමයි ප්‍රශ්ණෙ. අද අවසන් දිනය වෙන්න පුළුවන් සභාවේ අදහස් ප්‍රකාශ කරන. මම අද මගේ පෞද්ගලික අදහස් තමයි ප්‍රකාශ කළේ. කැම්පස් වලට යන තරුණ ළමයි එකතු කරගෙන විරෝධතා රැළි පවත්වමින් රට විනාශ කරන්නට ඇතැමුන් කටයුතු කරන බව එතුමා පැවසුවේය.

අවුරුදු පහක් තිස්සේ අපි එකට වැඩ කටයුතු කළා අද ඇත්තටම කණගාටුයි ජේෂ්ඨ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා තමන් සහභාගී වන අවසන් සභා වාරය මෙය බව මම එතුමා එක්ක වැඩකටයුතු කරලා තිබෙනවා. අපිට ආයිත් හමුවෙන්න ලැබෙයිද කියා දන්නේ නැහැ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සියළුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් යම්කිසි වරදක් වුවානම් සමාව ඉල්ලා සිටින බවත් පවසමින් එතුමා සැමගෙන් සමුගන්නා බව ප්‍රකාශ කළේය.

## VI. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරණ මහතා

ගරු සභාපතිතුමනි මම එක දවසක් මුහුදු වෙරළට ගියා ඒ වෙලාවේ එකපිට එක රැළි ඇවිත් ඒ සියල්ලම වෙරළේ වැදී බිඳී ගියා . ඒවගේම ඔය රැළිත් එසේමයි දැන් ඒ රැල්ල බිඳිලා ඉවරයි. අදවන විට මේ ප්‍රාෙද්ශිය සභාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රැකගන්නවා කියලා දිවුරුම් දීලා තියෙනවා. නමුත් ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන බව එතුමා පැවසුවේය.

ජනතා විමුක්ති පෙරමුණ මීට පෙරත් කිහිප අවස්ථාවක බලය ගන්න උත්සහ කරලා තියෙනවා. සන්නද්ධ අරගල තුළින් ඒ ජනතාව ප්‍රතික්ෂේප කරලා 3% බැහැලා ඉන්න අවස්ථාවක .69 ලක්ෂයක් අරන් පත් වී සිටි ජනාධිපතිවරයාට නොයෙකුත් කාරනා මත රජය පවත්වගෙන යෑමට හැකියාවක් නොලැබුණු අවස්ථාවේදී මේ ජනතා විමුක්ති පෙරමුණ විසින් මෙන්න හොරකම් කරනවා පිටරට ඉන්න පිරිසට සල්ලි එවන්න එපා කියලා මතයක් පතුරවලා ඩොලර් හිඟයක් ඇති කලා. මේ රටේ වෙච්ච දේට ජනතා විමුක්ති පෙරමුණ වගකිව යුතු බව එතුමා පැවසුවේය. මෙම උද්ඝෝෂණ වලට ජනතාව පහර දෙනු ඇතැයි එතුමා පැවසුවේය. තක්කඩින්ට තක්කඩි කියන්න ඕනි හොරුන්ට හොරු කියන්න ඕනි.

අදවන විට රුපියල ශක්තිමත්වෙමින් පවතිනවා. ඉදිරියේදී බඩු මිල අඩුවෙනවා. ජනතා විමුක්ති පෙරමුණට මේවා බලන් ඉන්න බැරුව සිටින බව එතුමා පැවසුවේය. ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා යටතේ රට ස්ථාවර වෙමින් පවත්න බවත් ඒ තුළින් ජනතාවට යහපතක් වේවායි පතමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

## VII. ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා

මම හිතන්නේ අද අපේ අවසාන දවස . අපි මුලින්ම සභාවට පත්වුනේ 88/89 කාලයේ ඒ වෙනකොට ජනතා විමුක්ති පෙරමුනේ කලබල කාලයේ. ගරු වන්නිආරච්චි මැතිතුමාගේ ඉල්ලීමට අනුව දේශපාලනයට ආවා .ප්‍රාදේශිය සභාවට ඉල්ලා තේරී පත්වුනා . දෙවන වරටත් හපුගස්තැන්න ඩිවිසන් එකේම ජනතාවගේ කැමැත්තෙන් පත්වුනා.

මෙවර දේශපාලනය එන්නේ නැහැ කියලා සිටියේ නමුත් නැවත ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා හා තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ සාකච්ඡාවෙන් අනතුරුව නැවත නාම යෝජනා සඳහා අත්සන් තබන ලද බව එතුමා පැවසුවේය. දේශපාලනය පිළිබඳව කළකිරීමක් නොමැති බවත්, දේශපාලනික වශයෙන් පක්ෂය කඩා වැටී තිබූ අවස්ථාවක නැවත පොහොට්ටුව ලාංඡනයෙන් නව පක්ෂයක් පිහිටුවමින් අවුරුදු කිහිපයක් ඇතුලත් විශාල ජයග්‍රහණයක් අත්කරගත් බවද එතුමා පැවසුවේය. 78 සාපය කියා කතා කරනවා නමුත් එදා රට තිබුණු තත්වයයි අද තත්වයයි බලද්දි ඒ කතාව සාධාරණ නොවන බව එතුමා පැවසුවේය . අදවන විට රත්නපුරයේ තිබෙන කාපට් පාරවල් ප්‍රමාණය. ඒ වාගේම රත්නපුර මහ රෝහලේ අද තත්වය පිළිබඳව බැලිය යුතු බවත් මේවා කලෙන් කාලෙට යම්කිසි තත්වයකට ගේන්න අපේ පක්ෂ කටයුතු කර ඇති බවත්, ඒවා ගිනිතියලා කාබාසිනියා කරන්න තවත් පිරිසක් සිටි බවත් එතුමා සඳහන් කළේය. අපේ රටේ සමස්ථ ආර්ථිකයම විනාශ කලේ මේ ජනතා විමුක්ති පෙරමුණ බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන්ම අඩපන කලා.මාර්ග පද්ධතිය විනාශ කළා,පාළම් වලට බෝම්බ තියලා විනාශ කළා ට්‍රාන්ස්පෝමර් ටික විනාශ කළා ඒ වගේ කටයුතු තමයි මේ හැත්තෑ හතේ සාපය කියන්නේ මේ ටික තමයි. අවුරුදු දෙක තුනක් ආපස්සට ලියා තමයි. නමුත් කොරොනා අවස්ථාවේදී ගෝඨාභය මහත්තයා බෙහෙත් ටික විඳලා ජනතාවගේ ජීවිත බේරලා දුන්නා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ ගම්වල කිය කියා යනවා පොහොට්ටුවට ඡන්දය නැහැ කියලා . නමුත් කිසි කෙනෙක් තෝරලා බේරලා කටයුතු නොකළ බව එතුමා පැවසුවේය. ඉදිරියට අපි ආවත් නැතත් මේ කටයුතු අලුත් පිරිසක් ඇවිත් සිදුකරගෙන යා යුතු ඉව එතුමා පැවසුවේය. රොහාන් මන්ත්‍රීතුමා පැවසූ ගල්ලෑල්ල උපකාර්යාලයේ තේ පැළ සිටුවීමේ කටයුතු සම්බන්ධව සම්පූර්ණ අධීක්ෂන කටයුතු සිදුකරන්නේ මම. වසර ගණනාවක් අපි එකතුවෙලා කටයුතු කළා. අපි පසුගිය සභා ධුර කාලයේ මන්ත්‍රීවරු 22 ක් සිටින කාලයේ පක්ෂ භේදයෙන් තොරව ඉතාමත් එකමුතුකමින් වැඩකටයුතු කළා. නමුත් මෙවර 36 දෙනෙක් සමඟ කටයුතු කළ මෙම කාලයේ විවිධ වූ ප්‍රශ්ණ ඇති වුනා එකමුතු කමක් නොතිබුණු බව එතුමා පැවසුවේය. මෙම සභාවේ දී කතා කරන්න ඇතැම් අය දන්නේ නැහැ. සභාවක හැසිරිය යුතු ආකාරය දන්නැහැ වට්ටි අම්මලා වගේ සමහරු කෑකෝ ගහනවා. සභාවේ ගරුත්වය තියා ලන්නේ නැහැ. අලේ අම්මා තාත්තගේ කොච්චර වැරදි තිබුණත් ඒ වා පිටට කියා අපහාස කරන්නේ නැහැ. ඒවා අභ්‍යන්තරයේ විසඳගන්න ඕනි. ඇතැම් අය එහෙම නැහැ ෆේස් බුක්වල සමාජ මාධ්‍ය ජාලා වල දාලා රත්නපුර ප්‍රාේදශිය සභාවේ ගරුත්වය නැතිකළ බව එතුමා පැවසුවේය. මේ සභාව අපේ අම්මා තාත්තා ලෙස සිතා කටයුතු කළා නම් හොඳයි කියලා කියන බවත්, විවේචනයෙන් හැදෙන අවස්ථා තිබුණත් ඇතැම් විට විවේචනය නිසා ප්‍රශ්ණ ඇතිවුන බවත් විවේචනය කරන පිරිස 100%ක්ම නිවැරදි අයමද යන්න සිතිය යුතු බවත් එතුමා පැවසුවේය. අපි 36ක් සිටියා ඇතැම් අය හැරෙන්නට බොහෝ දෙනා අපි සමඟ සුහදව කටයුතු කළ බව එතුමා පැවසුවේය.

මන්ත්‍රීවරුන්ගේ සුබ සාධක සංගමයේ වාර්තාවක් ඉල්ලා තිබුණා නමුත් ඒක අද දෙන්න බැරි වුනා දින දෙක තුනක් ඇතුළත එම වාර්තාව ලබා දීමට කටයුතු කරනවා. නැවත වතාවක් සභාවට එන්නට හැකියාවක් ලැබුණොත් සහයෝගයෙන් වැඩකරමුයැයි පවසමින් එතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

## VIII. ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා

අද සභාවේ කටයුතු සුහදව සිදුකර ගෙන යාමට අවස්ථාව සැලසුනා. සභවේ වෙන දේවල් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරිම හොඳයි. මුදල් කාරක සභාවේ හිටියත් අනෙකුත් කමිටුවල හිටියත් අපි ඒවා පිළීබඳව විනිවිදභාවයෙන් කටයුතු කළා. පොහොට්ටුව පක්ෂය විදියට අපි කැමතියි පළාත් පාලන මැතිවරණය කල් නොදමා තියෙනවානම්නමුත් මැතිවරණයක් තියන්න ඕනි අවස්ථාවක් නෙවෙයි. මීට කලින් මෙය තියන්න තිබුණෙ කොහොම නමුත් මේ කාලයේ මිනිසුන්ට වෙන ප්‍රශ්ණ තියෙන්නේ .ඔය මැතිවරණය තියන්න කියලා කෑගහන ජනතා විමුක්ති පෙරමුණ පවා ඡන්දය තියන්න කැමැත්තක් නොදක්වන බව ජේනවා. ඇතැම් පක්ෂ නායකයින් ඡන්දය නොතබන ලෙසට හොර රහසේ ප්‍රකාශ කරන බවට ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කරනු ලැබූ කතාවේදී තේරුම් ගිය බව එතුමා පැවසුවේය.

ගමක් ගමක් ගානෙ රැස්වීම් පවත්වාගෙන ගියාට ගහක් ගහක් ගානේ කොඩි එල්ලා තිබුණට ඡන්දය නොලැබෙන බව එතුමා පැවසුවේය. රතුපාට කොඩිය වෙනුවට රෝසපාට කොඩිය තමයි එල්ලන්නේ එහෙම තමයි දැන් 3% වැඩි කරගන්න උත්සහ කරන්නේ. මම ඇත්තටම තනියම හිතනකොට හිතෙනවා ඇත්තටම ජාතික ජනබලවේගයට බලය එනවානම් හොඳයි කියලා මොකද ජනතාව ඉල්ලන දේ ලැබෙයිද කියලා බලන්න මම කැමතියි. නමුත් ආණ්ඩුවක් හදන්න බැහැ පළාත් පාලන මැතිවරණයක් ජයග්‍රහණය කරලා. මේ මැතිවරණ වලදී ඔය පක්ෂය ඉතිහාසයේ ඉදලම මොකක්ද කළේ කියලා අපි දන්නවා. පළාත් සභා 81 දී එද්දී පලාත් සභා විරෝධී කියලා කටයුතු කළා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පළාත් සභා විරෝධිව තමයි එවකට සිටියේ. එක්සත් සමාජවාදී පෙරමුණ කියලා අනෙකුත් වමේ පක්ෂ එකතුවෙලා කණ්ඩායමක් ගොඩනැගුණා .ඒ වෙලාවේ ඒ කණ්ඩායමේ හිටපු විජේකුමාරතුංග පවා ඝාතනයට ලක්වුණා . ඒ කේ හිටපු ප්‍රාේදශිය නායකයින්ට පවා තර්ජන තිබුණා. ඒ කාලේ එක්සත්

සමාජවාදී පෙරමුණට වැඩ කළා මගේ දෙවෙනි මැතිවරණය ඒක .ඒ අවස්ථාවේදී රට ජනතා විමුක්ති පෙරමුණෙන් රට එනවා මාව හොයාගෙන හමුදාවෙනුත් එනවා හොයාගෙන ඉතින් අපි කැලේ හැංගිලා තමයි හිටියේ. අද තියෙන දේශපාලන තත්වයත් එක්ක රට තිබුණු හැටි පිළිබඳව අමතක වෙනවා. මේ අවුරුදු 70 පිළිබඳව කතා කරන විට අවුරුදු 30ක්ම අයින් කරන්න ඕනි. වෙනම උසාවියක්, පොලීසියක් වෙනම ආණ්ඩුවක් පවත්වාගෙන ගියා උතුරු නැගෙනහිර ප්‍රදේශයන් වල. සටන් විරාම අවස්ථාවේ අපි යාපනයේ ගිය අවස්ථාවක හමුදා කඳවුරට හැඳුනුම්පත පෙන්නලා යන්න ඕනි. ඒ වගේම එල්.ටී.ටී .ඊ එකේ හමුදාවටත් හැඳුනුම්පත් පෙන්නලා තමයි යන්න ඕනි වෙලාවක් තියෙනවා ගිහින් එන්නත නමුත් අපිට වෙලාට එන්න බැරිවුනා ඒ අවස්ථාවේදී එවලෙම් දඩ ගැහැව්වා.වෙනනම පාලනයක් ගෙනිව්වා. 88/89 කාලෙ තව අවුරුදු දෙකක් අඩු කරන්න ඕනි. ඊට පස්සේ 83 කළු ජූලිය. රටේ ප්‍රශ්ණ පිළිබඳව නායකයො කතා කළා ඇතැම් අයගෙන් වැරදි වෙන්න ඇති ගෝඨාභය මහත්තයා බදු අඩු කරන කොට හොඳයි. රටේ පවතින තත්වය හමුවේ තාවකාලිකව බදු වැඩි කරනවා ඒ අවස්ථාවේදී කෑ ගහනවා. බදු වැඩි කිරීම හොඳයි කියලා කියනවා නෙවෙයි. නමුත් ආර්ථික තත්වය ගොඩනැගීම සඳහායි මේ කටයුතු කරන්නෙ.

ඕනෑම අවස්ථාවක මැතිවරණයට මුහුණ දීමට අපිට හැකියාව තිබෙන බවත්, මේ අවස්ථාවේදී පැහැදිලි මතයක් ජනතාවගෙන් ලබා ගැනීමට හැකියාවක් නැති බව එතුමා පැවසුවේය. මහත්මා ගාන්ධි තුමා පැවසූ ආකාරයට සත්‍යට මුහුණ දිය හැක්කේ පර්යේෂනයෙන් මිස අරගලයෙන් හෝ තර්කයෙන් නොවන බවයි .යන්න එතුමා පැවසුවේය. මෙහි එන්නේම විකෘති ප්‍රතිඵලයක් එසේ සිදුවීම තමයි බලාපොරොත්තුව ජාතික ජන බලවේගයට හා අනෙකුත් පක්ෂ වලට.ජනතාව බලාපොරොත්තු වන මේ මන්ත්‍රී ධුර ප්‍රමාණයන් අඩුකර කොට්ඨාශ සීමා නීරනයන් සමඟ එනවානම් හොඳයි කියන මතයේ තමයි මම නම් ඉන්නේ.

රාජ්‍ය මැණික් සංස්ථාව බැකෝ යන්ත්‍ර යොදලා මැණික් නිධි ලබා ගැනීම හේතුවෙන් විශාල පරිසර හානියක් සිදුවෙනවා. මල්වල ප්‍රෙද්ශයෙත් විශාල ලෙස තියෙනවා. ගොඩවෙල ප්‍රදේශයේ අළුතින්ම හඳපු පාර ගිලා බැසීමවලට ලක්වුනා .පතල් කර්මාන්තය සිදුකිරීම සම්බන්ධව විරෝධතාවක් නෙවයි මේ කියන්නෙ . මෙවැනි කැනීම සඳහා එකවර අනුමැතිය ලබා දීම සම්බන්ධව පරීක්ෂනයක් සිදුකර කටයුතු කළයුතු බවත්, මේ සම්බන්ධව පසු විපරමක් සිදුකරනවාද යන්න සොයා බැලිය යුතුය. කළුගඟේ ජලය භාවිතා කරමින් පානීය ජලය සපයා ගන්නවා. කළුගඟේ ජලය සෑම අවස්ථාවකම මෙම අවිධිමත් මැණික් ගැරීම හේතුවෙන් අපිරිසිදු තත්වයට පත්වෙනවා. ගඟ දෙපස ඉවුර කඩා හැලී පාරිසරික විනාශයන් සිදුවෙනවා. මේ පිළිබඳව බලධාරීන් එක්ව සාකච්ඡා කර මෙම කර්මාන්තයත් සුරක්ෂිත වන අයුරින් පාරිසරික සුරක්ෂිතභාවයත් රකිමින් කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය.

අද රැස්වීම අවසාන එකද කියන්න ස්ථිරවම කියන්න දන්නේ නැහැ. ඒවා බලධාරීන් විසින් ගන්නා තීන්දු තීරණ බවත්, කෙසේ නමුත් මෙම ප්‍රාදේශිය සභාවේ කටයුතු වෙනුවෙන් ක්‍රියාකාරීව ඉදිරියේදීත් දායකවන බව එතුමා සඳහන් කරමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී

### IX. ගරු මන්ත්‍රී කමනි සේනාධිර මහත්මිය

පළාත් පාලන ආයතනවල ධුර කාලය වසර හතරක කාලය අවසන් වීමෙන් පසුව තවත් වසරක් කාලයක් දීර්ඝ කිරීමෙන් පසුව මේ වන විට මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා නාමයෝජනා අත්සන් කර බාර දීලි තියෙනවා. අපි මේ අවස්ථාවේ රජයේ සේවකයෙක් හැටියට මොකද කරන්නේ කියන තත්වයකට පත්වෙලා තියෙනවා. මොකද පසුගිය දිනක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී පැවසුවා මැතිවරණයක් තියන්න මැතිවරණයක් තියෙනවාද කියලා. ඒ වෙනකොටත් නාම යෝජනා දීලා තිබුණෙ. එතුමා කරන ලද ප්‍රකාශය පිළිබඳව කණගාටු වන බව එතුමිය පැවසුවේය.

මේ වන විට රජයේ සේවකයින් අපහසුතාවයට පත්වෙලා තියෙනවා. මේ වන විට වැටුප් රහිත නිවාඩු ලබාගෙන නිවෙස් වලට වී සිටිනවා. ඇතැම් පිරිස් පතල් කර්මාන්තය කරනවා. මෙම වැටුපෙන් ජීවත් වන රජයේ සේවකයින් ඉන්නවා. ඔවුන් මහත් අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. මෙම මැතිවරණය තැබීම සඳහා තීන්දු තිරණ ගනු ලැබුවේ ඉහළ බලධාරීන් නිසා හරියටම මැතිවරණය තියෙනවාද නැද්ද යන්න දැනුම් දෙන ලෙස ඉල්ලා සිටින බව එතුමිය පැවසුවේය.

### X. ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා

මගේ අදහස තිබුනේ සභාවේ කටයුතු හරියට කිරීමට සැළසුම් කිරීම තමයි අරමුණ තිබුණෙ. රටේ දේවල්වත්, ලෝකයේ දේවල්වත් අපිට හඳන්න බෑ නමුත් සභාවට අදාල දේවල් පිළිබඳව කතා කළ යුතුයි. තිබෙන සම්පත් උපයෝගී කරගෙන සභාව ඉදිරියට ගෙනයන්නේ කොහොමද කියන එකයි කතා කළයුත්තේ. අද සියළුම දෙනාගේ අදහස් ඉදිරිපත් කරනු ලැබුවා . අද දින ගරු සභාපතිතුමා ත් සිටියානම් වටිනවා. එතුමා අද දින පෞද්ගලික නීතිමය කාරණයක් හේතුවෙන් අද දින පැමිණියේ නැහැ. එතුමා වෙනුවෙන් සභාවේ කටයුත සිදුකරගෙන යාමට කැපවීමෙන් කටයුතු කරනු ලැබූ බව එතුමා පැවසුවේය.

ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්නට සියළුම දෙනා උත්සහා කළයුතු බවත්, සභාව අද දින අවසන් දිනය වුවත් අපිට සන්තෝෂ වෙන්නට හැකියාවක් තියෙනවා සෑම අවස්ථාවකම කටයුතු කළේ මහජනතාව වෙනුවෙන් ඒ නිසා සතුටු විය හැකි බව එතුමා සඳහන් කළේය.

මන්ත්‍රීවරු කිහිපි දෙනෙක්ම ප්‍රකාශ කළා ඊළඟ මැතිවරණයට ඉදිරිපත් නොවන බව පැවසුවා. මන්ත්‍රීවරයෙක් නොවනුත් ජනතාවට සේවය කිරීමේ හැකියාව තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ජනතාවට සේවය කිරීම සඳහා සභාව සමඟ දිගටම රැදී සිටිමින් කටයුතු කරන ලෙසට . අද දින විශාල කාරණාවන් පිළිබඳව කතා කරනු ලැබුවා. සභාවේ කටයුතු සහයෝගයෙන් අද දින කරගෙන යාමට අවස්ථාව සකසා දුන් සි
යළුම මන්ත්‍රීවරුන්ට හා ලේකම් තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළුම දෙනාටත්, මාධ්‍යවේදී මහතාටත් ස්තූතිය එල කරමින් අද දින මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**